සියලු ම හිමිකම් ඇවිරිණි

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අවසාන විභාගය - 2011 ජුලි

## (58) බදුකරණය

Taxation

2011-07-16
පෙරවරු
[9.00 – 12.00]

**කාලය: පැය 03 යි.**

පිටු ගණන: 07
ප්‍රශ්න ගණන: 05

- **අයදුම්කරුවන්ට උපදෙස්:**

 *(1)* ***සියලු ම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතු ය.***
 *(2)* *ඉල්ලුම් කරන ලද මාධ්‍යයට අදාලව, එක් භාෂාවකින් පමණක්, ඔබ වෙත සපයන ලද පොත්වල උත්තර ලියන්න.*
 *(3)* *ගණක යන්ත්‍ර භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
 *(4)* ***පෙරවැඩ** සහ සියලු ගණනය කිරීම් සියල්ල ඉදිරිපත් කරන්න. ඔබ විසින් කරනු ලබන **උපකල්පන** කිසිවක් වේ නම්, ඒවා පැහැදිලිව සඳහන් කරන්න.*
 *(5)* *ලකුණු 100.*

---

01. **සීමාසහිත රත්මුතු (පුද්ගලික) සමාගම** කොළඹ ලියාපදිංචි කාර්යාලය පිහිටි වාසික සමාගමකි. 2006 පෙබරවාරි 10 දින සංස්ථාගත කළ සමාගම, ස්වර්ණාභරණ නිෂ්පාදනය කර දේශීය ගනුදෙනුකරුවන්ට හා සංචාරකයන්ට විකිණීමේ ව්‍යාපාරික කටයුතු 2006 මැයි මස 4 වන දින ආරම්භ කරන ලදි. සමාගම **"රත්මුතු"** යන වෙළෙඳ නාමය 2006/2007 තක්සේරු වර්ෂය තුළදී මිලදී ගන්නා ලදි. සමාගමට කොළඹ කොටුවේ හා කොල්ලුපිටියේ ප්‍රදර්ශනාගාර දෙකක් ඇත. කොල්ලුපිටියේ ප්‍රදර්ශනාගාරය 2009 ජුනි 25 දින විවෘත කරන ලදි.

පහත තොරතුරු 2009/2010 තක්සේරු වර්ෂය සඳහා අදාල වේ.

සමාගම සාමාන්‍ය කොටස් 100,000 එකක් රු.12/- බැගින් වසර තුළදී නිකුත් කර ඇත. කොටස් නිකුතුවට අදාලව ගෙවන ලද මුද්දර ගාස්තුව ආදායම් ප්‍රකාශයට හර කර ඇත. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා එක් කොටසක වටිනාකම රු.15/- ක් ලෙස තක්සේරු කර ඇත.

සියළු වියදම් හර කිරීමෙන් හා සියළු ආදායම් බැර කිරීමෙන් පසු සමාගමේ ආදායම් බදු වලට පෙර 2010 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ ලාභය රු.13,450,000/- කි.

**ගිණුම් වලට සටහන්:**

**<u>1 වන සටහන</u>**

**වෙනත් ආදායම් වල සාරාංශය**

| | රු. |
|---|---:|
| භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලිය | 270,000 |
| ස්ථාවර තැන්පතු මත පොලිය | 250,000 |
| ලී බඩු ඉවත් කිරීමේ ලාභය | 2,000 |
| ලාභාංශ ආදායම | 500,000 |

**<u>2 වන සටහන</u>**

**ආදායම් බදු ගිණුමේ සාරාංශය**

| | රු. |
|---|---:|
| 2009 අප්‍රේල් 01 දිනට ගෙවිය යුතු ආදායම් බද්ද | 1,230,000 |
| වසර සඳහා වෙන් කිරීම | 4,000,000 |
| 2008/2009 වසර සඳහා ස්වතක්සේරු මත ගෙවීම් | (1,230,000) |
| 2009/2010 වසර සඳහා ස්වතක්සේරු මත ගෙවීම් | (3,560,000) |
| පොලී ආදායම මත රඳවා ගැනීමේ බද්ද | (25,000) |
| 2010 මාර්තු 31 දිනට ගෙවිය යුතු ආදායම් බද්ද | 415,000 |

3 වන සටහන

**දේපල, පිරියත හා උපකරණ පිළිබඳ විස්තර:**

**පිරිවැය**

| විස්තර | 2009.04.01 දිනට ශේෂය රු. | එකතු කිරීම් රු. | ඉවත් කිරීම් රු. | 2010.03.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ඉඩම | 5,000,000 | - | - | 5,000,000 |
| ගොඩනැගිලි | 2,100,000 | - | - | 2,100,000 |
| වෙළෙඳ නාමය | 2,000,000 | - | - | 2,000,000 |
| විදුලි ජනක යන්ත්‍රය | 400,000 | 250,000 | - | 650,000 |
| මොටර් වාහන | 6,500,000 | - | - | 6,500,000 |
| කාර්යාල උපකරණ | 900,000 | 200,000 | - | 1,100,000 |
| මැණික් කැපීමේ යන්ත්‍රය | 450,000 | | - | 450,000 |
| වායු සමීකරණ | 650,000 | 240,000 | - | 890,000 |
| ලී බඩු | 340,000 | 120,000 | 35,000 | 425,000 |
| පරිගණක | 200,000 | 120,000 | 100,000 | 220,000 |
| පරිගණක මෘදුකාංග | 150,000 | - | - | 150,000 |
| **එකතුව** | **18,690,000** | **930,000** | **135,000** | **19,485,000** |

**ක්ෂය කිරීම්**

| විස්තර | 2009.04.01 දිනට ශේෂය රු. | වර්ෂය සඳහා ක්ෂය රු. | ඉවත් කිරීම් රු. | 2010.03.31 දිනට ශේෂය රු. |
|---|---|---|---|---|
| ඉඩම | - | - | - | - |
| ගොඩනැගිලි | 210,000 | 105,000 | - | 315,000 |
| වෙළෙඳ නාමය | 300,000 | 100,000 | - | 400,000 |
| විදුලි ජනක යන්ත්‍රය | 400,000 | 250,000 | - | 650,000 |
| මොටර් වාහන | 1,900,000 | 650,000 | - | 2,550,000 |
| කාර්යාල උපකරණ | 108,000 | 36,000 | - | 144,000 |
| මැණික් කැපීමේ යන්ත්‍රය | 135,000 | 45,000 | - | 180,000 |
| වායු සමීකරණ | 175,000 | 65,000 | - | 240,000 |
| ලී බඩු | 102,000 | 34,000 | 7,000 | 129,000 |
| පරිගණක | 120,000 | 40,000 | 100,000 | 60,000 |
| පරිගණක මෘදුකාංග | 150,000 | - | - | 150,000 |
| **එකතුව** | **3,600,000** | **1,325,000** | **107,000** | **4,818,000** |

(1) සමාගම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2007 අප්‍රේල් මස නිම කරන ලදී.

(2) සමාගමට මෝටර් කෝච් රථයක් හා මෝටර් කාර් රථයක් අයිතිව ඇත. 2007/2008 තක්සේරු වර්ෂයේදී රු.3,000,000/- කට අත්පත් කරගත් මෝටර් කෝච් රථය සමාගමේ සේවකයන් පදිංචි ස්ථානයේ සිට වැඩ කරන ස්ථානයටත් වැඩකරන ස්ථානයේ සිට පදිංචි ස්ථානයටත් ප්‍රවාහනය කිරීම සඳහා පාවිච්චි කරනු ලැබේ. 2006/2007 තක්සේරු වර්ෂයේදී අත්පත් කරගත් මෝටර් කාර් රථය කළමණාකාර අධ්‍යක්ෂවරයා විසින් රාජකාරි කටයුතු සහ පුද්ගලික කටයුතු සඳහා පාවිච්චි කරනු ලැබේ. නොමිලේ සපයන එම ප්‍රවාහන පහසුකමට අදාල මූල්‍ය නොවන ප්‍රතිලාභය කළමණාකාර අධ්‍යක්ෂවරයාගේ උපයනවිට ගෙවීමේ බදු (PAYE) ගණනය කිරීමේදී අදාල කරගෙන ඇත. කළමණාකාර අධ්‍යක්ෂවරයා පාවිච්චි කරනු ලබන රථයේ පිරිවැය රු. 3,500,000/- කි.

(3) මාසික වේතනය රු.15,000/- ක් වන කාර්යාල සහායකගේ පාවිච්චිය සඳහා මෝටර් බයිසිකලයක් මෙහෙයුම් කල්බදු ගිවිසුමක් යටතේ ලබා ගන්නා ලදී. කල්බදු ගිවිසුම 2008 නොවැම්බර් 01 දිනෙන් ආරම්භ වී වසර 4 ක කාලයක් සඳහාය. මාසික කල්බදු වාරිකය රු.5,000/- කි. ගෙවන ලද කල්බදු වාරික ලාභා'ලාභ ගිණුමට හර කර නැත.

(4) 2007/2008 තක්සේරු වර්ෂයේදී අත්පත් කර ගත් මේසයක් 2009 දෙසැම්බර් 01 දින විකුණා අළුත් මේසයක් රු.28,000/- කට 2010 මාර්තු 15 දින මිලට ගන්නා ලදී.

(5) පරිගණක හා දේශීයව සකස් කරන ලද පරිගණක මෘදුකාංග 2006/2007 තක්සේරු වර්ෂයේදී අත්පත් කර ගන්නා ලදී. අකුණු සැර වැදීමෙන් හානි වූ පරිගණකය ඉවත් කර ඒ වෙනුවට නව පරිගණකයක් මිලට ගන්නා ලදී.

(6) දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති අනෙකුත් සියළු වත්කම් 2006/2007 තක්සේරු වර්ෂයෙදී සමාගම් ව්‍යාපාර කටයුතු කරන අවස්ථාවේදී මිලට ගන්නා ලදී.

<u>4 වන සටහන</u>

සමාගම රු.5,000,000/- ක ලාභාංශයක් ප්‍රකාශ කර ඇති අතර ඉන් රු.500,000/- ක් සමාගම විසින් ලද ලාභාංශ වලිනි.

<u>5 වන සටහන</u>

සමාගමේ පිරිවැටුමේ සංයුතිය පහත පරිදි වේ:

| පිරිවැටුම | රු. |
|---|---|
| දේශීය ව්‍යවහාර මුදල් සඳහා විකුණුම් | 125,340,000 |
| විදේශීය ව්‍යවහාර මුදල් සඳහා විකුණුම් | 25,250,000 |
| **එකතුව** | **150,590,000** |

වසර තුලදී අපනයන නොවීය.

<u>6 වන සටහන</u>

2010 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමේ ශුද්ධ ලාභය ගණනය කිරීමේදී ලාභා'ලාභ ගිණුමට හර කරන ලද සමහර වියදම් හා බැර කරන ලද සමහර ආදායම් වල විස්තර පහත දී ඇත.

(1) ප්‍රචාරණ වියදම් වල සංයුතිය:

| | රු. |
|---|---|
| නව ප්‍රදර්ශනාගාරය සොයා ගැනීම සඳහා වූ පුවත්පත් දැන්වීම් පිරිවැය | 12,000 |
| **රත්මුතු** භාණ්ඩ ප්‍රවර්ධනය සඳහා විද්‍යුත් මාධ්‍ය සඳහා දැරූ පිරිවැය | 120,000 |
| සවිකරන ලද නව නාම පුවරුවේ පිරිවැය | 65,000 |

(2) නව මැණික් කැපීමේ යන්ත්‍රයක් පරීක්ෂා කිරීමට කළමනාකරණ අධ්‍යක්ෂවරයාව විදේශ රටකට යැවීම සඳහා සමාගම විසින් වසර තුල රු.525,000/- ක විදේශ ගමන් වියදමක් දරා ඇත.

(3) වසර තුල දරණ ලද වෙළෙඳපොල පර්යේෂණ වියදම රු.3,000,000/- කි.

(4) වසර තුලදී රු.57,000/- සංග්‍රහ වියදමක් දරා ඇත.

(5) රු.14,000/- නීති වියදමක් නව කල්බදු ගිවිසුමක් වෙනුවෙන් දරා ඇත. තවත් රු.12,000/- නීති වියදමක් බොල්ණය අයකර ගැනීම සඳහා දරා ඇත.

(6) කල්බදු ගිවිසුම සඳහා දරණ ලද මුද්දර ගාස්තුව රු.30,000/- කි. ලදුපත්වල අලවන ලද මුද්දර වල පිරිවැය රු.8,000/- කි.

(7) 2009 මැයි 01 දින සිට 2010 මාර්තු 31 දක්වා කාලය සඳහා ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද රු.3,600,000/- කි.

(8) අඩමාන ණය වෙන්කිරීමට අදාල තොරතුරු මෙසේය:

| | රු. |
|---|---|
| 2009 අප්‍රේල් 01 දිනට අඩමාන ණය වෙන් කිරීම | 240,000 |
| ලාභා'ලාභ ගිණුමට (විශේෂිත) | 40,000 |
| ලාභා'ලාභ ගිණුමට (පොදු) | 100,000 |
| පසුගිය වසර තුල කරන ලද විශේෂිත වෙන් කිරීම නැවත පොත් වලට ගෙන ඒම | (20,000) |
| 2010 මාර්තු 31 දිනට අඩමාන ණය වෙන් කිරීම | 360,000 |

වෙළෙඳ ණය රු.72,000/- ක් හා වෙළෙඳ නොවන ණය රු.12,000/- ක් බොල් ණය ලෙස වසර තුලදී ලාභා'ලාභ ගිණුමට කපා හරින ලදී.

(9) වාහන අළුත්වැඩියා හා නඩත්තු වලට අදාල විස්තර මෙසේය;

| | **කලමණාකාර අධ්‍යක්ෂවරයාගේ මෝටර් රථය රු.** | **මෝටර් කෝච් රථය රු.** |
|---|---|---|
| ඉන්ධන | 180,000 | 125,000 |
| අළුත්වැඩියා හා නඩත්තු | 134,000 | 195,000 |
| **එකතුව** | **314,000** | **320,000** |

(10) රජයේ පිළිකා රෝහලේ ළමා වාට්ටුවට ප්‍රදානය කරන ලද කිරිපිටි වල පිරිවැය රු.35,000/- කි. "අපි වෙනුවෙන් අපි අරමුදල" ට කරන ලද මුදල් පරිත්‍යාගය රු.230,000/- කි.

(11) පාරිතොෂික ගෙවීමේ පනතේ විධිවිධාන වලට අනුව මූල්‍ය ප්‍රකාශ වල පාරිතෝෂික ප්‍රතිපාදනය සමාගම සිදු නොකරයි. කෙසේවෙතත් සමාගම වසර තුලදී අස්වී ගිය සේවකයෙකුට රු.325,000/- ක පාරිතෝෂිකයක් ගෙවා ඇත.

ඉහත තොරතුරු ඇසුරෙන්,

**ඔබ විසින්,** 2009/10 තක්සේරු වර්ෂය සඳහා, **සීමාසහිත රන්මුතු (පුද්ගලික) සමාගමේ:**

(a) එක් එක් ආදායම් ප්‍රභවයෙන් ලැබුණ ව්‍යවස්ථාපිත ආදායම,

(b) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(c) තක්සේරු කළ හැකි ආදායම,

(d) බදු අයකළ හැකි ආදායම,

(e) ගෙවිය යුතු දළ බද්ද,

(f) ගෙවිය යුතු ඉතිරි ආදායම් බද්ද

(g) බදු නිදහස් ආදායම් (වේ නම්),

ගණනය කළ යුතු ය.

(එකතු කල අගය මත බදු හා නොබෙදූ ලාභ මත බදු වල බලපෑම නොසලකා හරින්න)

(ලකුණු 35)

**02.** වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වන **බෝල්ටන්** වාසික පුද්ගලයෙකි. ඔහු වයස අවුරුදු 60 සම්පූර්ණ වීමෙන් 2004/2005 වසර තුළදී රජයේ සේවයෙන් විශ්‍රාම ගත්තේය. වෛද්‍ය **බෝල්ටන්** තම පුද්ගලික බෙහෙත් ශාලාව අවිස්සාවේල්ලේ පිහිටි තම නිවසේ පවත්වාගෙන යයි.

2009/2010 තක්සේරු වර්ෂයට අදාල ඔහුගේ ආදායම් තොරතුරු පහත දක්වේ:

(1) ශ්‍රී ලංකා රජයෙන් ලද මාසික විශ්‍රාම වැටුප රු.42,000/- කි.

(2) ඔහුගේ බෙහෙත් ශාලාව 2010 මාර්තු 31 දිනෙන් අවසන් වසර සඳහා ආදායම් සහ වියදම් ගිණුම පහත පරිදි වේ.

| **ආදායම්** | **රු.** | **වියදම්** | **රු.** |
|---|---|---|---|
| වෛද්‍ය සේවා ගාස්තු | 4,230,000 | බෙහෙත් ද්‍රව්‍ය මිලට ගැනුම් | 650,000 |
| බෙහෙත් ද්‍රව්‍ය විකිණීම | 1,459,452 | වැටුප් | 960,000 |
| | | විදුලි ගාස්තු | 180,000 |
| | | දුරකතන ගාස්තු | 75,000 |
| | | පරිගණකය මිලට ගැනීම | 80,000 |
| | | වෛද්‍ය සභාවට ගෙවූ වාර්ෂික දායක මුදල | 40,000 |
| | | විදේශ ගමන් වියදම් | 130,000 |
| | | ජලය | 63,000 |
| | | මෙවලම් | 189,000 |
| | | ලාභය | 3,322,452 |
| | **5,689,452** | | **5,689,452** |

වෙනත් තොරතුරු:

(i) බෙහෙත් තොගවල විස්තර පහත පරිදි වේ:

2009 අප්‍රේල් 01 දිනට රු.120,000/-

2010 මාර්තු 31 දිනට රු.135,000/-

(ii) විදේශ ගමන් වියදම් දරා ඇත්තේ විදේශ පුහුණුවීමකට සහභාගී වීම සඳහාය.

(iii) මෙවලම් මිලට ගෙන ඇත්තේ වසර තුළදී ඉවත දමන ලද ඒවා ප්‍රතිසම්පාදනය කිරීම සඳහාය.

(iv) දුරකතන, වතුර සහ විදුලි බිලෙන් 50% ක් පුද්ගලික පාවිච්චියට අදාල වේ.

(3) **වෛද්‍ය බෝල්ටන්** පදිංචිව ඉන්නේ ඔහුගේ සහෝදරයා වූ **ඔස්ටින්ට** අයත් නිවසකයි. ශුද්ධ වාර්ෂික වටිනාකම රු.80,000/- ක් වූ එම නිවසට රු.3,000/- ක නාමික මාසික කුලියක් ඔහු ගෙවනු ලැබේ. වෛද්‍ය බෝල්ටන් 2004/2005 තක්සේරු වර්ෂය තුළදී සාදා නිම කළ ඔහුගේ නිවස මසකට රු.10,000/- බැගින් කුලියට දී ඇත. එම නිවසේ කුලී වටිනාකම රු.72,000/- ක් වන අතර වරිපනම් රු.12,000/- කි.

(4) වර්ෂය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ඇති රු.2,000,000/- ක ස්ථාවර තැන්පතුවකින් ලද දළ පොලී ආදායම රු.280,000/- කි. භාණ්ඩාගාර බිල්පත් මත ලද පොලී ආදායම රු.200,000/- කි.

(5) ඔහු 1998 දී රු.1,500,000/- කට මිලට ගත් ඔහුගේ පුද්ගලික මෝටර් රථය විකුණන ලදී. පිරිවැය රු.2,200,000/- ක් වූ නව මෝටර් රථය මිලට ගැනීම සඳහා පැරණි රථයේ විකුණුම් ප්‍රතිෂ්ඨාව වූ රු.1,800,000/- පාවිච්චි කරන ලදී.

(6) ඔහු විසින් ලද ලාභාංශ පහත ඒවායින් සමන්විත වේ:

| | රු. |
|---|---|
| ලාභාංශ - බද්දෙන් නිදහස් ලාභ වලින් | 55,000 |
| ලාභාංශ - වෙනත් සමාගම් වලින් ලද 10% බැගින් වූ රඳවා ගැනීමේ බද්ද අඩුකර ගනු ලැබූ | 54,000 |

(7) **වෛද්‍ය ඩොල්ටන්** ඔහුගේ බැංකුවෙන් නිවසක් ඉදිකිරීම සඳහා රු.2,000,000/- ක ණයක් හා කුලියට දුන් නිවස සඳහා ලී බඩු මිලට ගැනීම සඳහා රු.354,000/- ක ණයක් ලබා ගන්නා ලදී. ණය සඳහා ඔහු වසර තුළදී බැංකුවට පහත ගෙවීම සිදුකරන ලදී.

| | **නිවස ඉදිකිරීම සඳහා වූ ණය රු.** | **ලී බඩු මිලට ගැනීම සඳහා වූ ණය රු.** |
|---|---|---|
| පොලී ගෙවීම | 120,000 | 67,000 |
| ප්‍රාග්ධන කොටස ආපසු ගෙවීම | 140,000 | 98,000 |

(8) වසර තුළදී රු.15,000/- ක මාසික ගෙවීමක් උසාවි නියෝගයක් මත ඔහුගේ කලින් බිරිඳට ගෙවන ලදී.

(9) **වෛද්‍ය ඩොල්ටන්** විසින් ගෙවන ලද වෛද්‍ය රක්ෂණ වාරිකය රු.55,000/- කි.

(10) ගමේ පංසලට ගෙවන ලද මුදල් පරිත්‍යාගය රු.10,000/- කි. අනුමත පුණ්‍යායතනයකට කරන ලද ද්‍රව්‍යමය පරිත්‍යාග රු.24,000/- කි.

ඉහත සඳහන් තොරතුරු ඇසුරෙන්:

**ඔබ විසින්,** 2009/10 තක්සේරු වර්ෂය සඳහා, **වෛද්‍ය ඩොල්ටන් ගේ:**

(a) එක් එක් ආදායම් ප්‍රභවයන්ගෙන් ලැබුන ව්‍යවස්ථාපිත ආදායම,

(b) මුළු ව්‍යවස්ථාපිත ආදායම,

(c) තක්සේරු කළ හැකි ආදායම,

(d) බදු අයකළ හැකි ආදායම,

(e) දළ බදු වගකීම,

(f) ශුද්ධ බදු වගකීම, සහ

(g) බදු නිදහස් ආදායම (වේ නම්),

ගණනය කළ යුතු ය. (ලකුණු 30)

**03.** **නො කොස්ට් (පුද්ගලික) සමාගම** බදු උපදේශන සමාගමකි. පහත තොරතුරු 2009 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා ඔබට දී ඇත.

*අදාල තැන්හි සියළුම සංඛ්‍යා එකතු කළ අගය මත බදු ඇතුලත්ය.*

| | රු. |
|---|---|
| කාර්තුව සඳහා ලද දේශීය උපදේශන ගාස්තු | 3,024,000 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් වලින් ලද විදේශීය උපදේශන ගාස්තු (සේවාව ශ්‍රී ලංකාවෙන් පිටතදී පරිභෝජනය කර ඇත) | 2,000,000 |
| කාර්යාල නඩත්තු සේවා සපයන සමාගමකට ගෙවන ලද වියදම (එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති සමාගමකි) | 448,000 |
| වැටුප් හා වේතන | 1,000,000 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ගාස්තු | 291,200 |
| විදුලිය | 120,000 |
| එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි ඇති ආයතනයකට ගෙවන ලද සම්මන්ත්‍රණ ගාස්තු | 806,400 |
| පසුගිය කාර්තුවෙන් ඉදිරියට ගෙනා හිලව් නොකළ එකතු කළ අගය මත යෙදවුම් බද්ද | 125,000 |
| ජූලි සහ අගෝස්තු මාස සඳහා ගෙවන ලද එකතු කළ අගය මත බද්ද | 10,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) 2009 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් කාර්තුව සඳහා ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද ගණනය කරන්න.

(b) යම් යෙදවුම් බදු කොටසක් ඉදිරි කාර්තුව සඳහා ඉදිරියට ගෙන යා හැකිද? ඇති නම් වටිනාකම දක්වන්න.

(c) ඉහත කාර්තුව සඳහා එකතු කළ අගය මත බදු වාර්තාව ඉදිරිපත් කළ යුතු දිනය කුමක්ද? (ලකුණු 15)

**04.** (a) වලංගු ආදායම් බදු අභියාචනාවක තිබිය යුතු ලක්ෂණ දක්වන්න. (ලකුණු 05)

(b) දේශීය ආදායම් කොමසාරිස්වරයා විසින් ප්‍රමාද වූ ආදායම් බදු අභියාචනා පිළිගත හැකි අවස්ථා දක්වන්න. (ලකුණු 03)

(මුළු ලකුණු 08)

**05.** (a) උපයන විට ගෙවීමේ බදු ක්‍රියාත්මක කිරීමේදී සේවා යෝජකයාගේ බැඳියාවන් (obligations) / වගකීම දක්වන්න.

(ලකුණු 05)

(b) 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට අදාලව පහත දෑ නිර්වචනය කරන්න.

(i) නිශ්චිත පුද්ගලයා (Specified person).

(ii) දරුවා (Child). (ලකුණු 07)

(මුළු ලකුණු 12)

- o0o -